

# 3 අපේ සංස්කෘතිය

## හැඳින්වීම

ශ්‍රී ලාංකික ජන සමාජය විවිධ ජන වර්ග, විවිධ ආගම් හා විවිධ භාෂා කතා කරන කණ්ඩායම්වලින් සමන්විත බහු සංස්කෘතික ස්වරූපයක් උසුලනු ලබයි. එක් එක් ජනවර්ගයට මෙන්ම ආගමික කණ්ඩායම්වලට සුවිශේෂ වූ සංස්කෘතික ලක්ෂණ දක ගත හැකි ය. එසේම සෑම ජන කණ්ඩායමකටම මෙන්ම ආගමික කණ්ඩායමකට පොදු වූ සංස්කෘතික ලක්ෂණ ද පවතී. ඒවායේ වෙනස්කම් මෙන් ම සමානකම් ද හඳුනා ගැනීම අත්‍යවශ්‍යය. ශ්‍රී ලාංකික ජන සමාජයේ යහපත් පුරවැසියෙකු වශයෙන් සමගිය, සහජීවනය, සමානාත්මතාව ඇති කිරීම උදෙසා කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

### සංස්කෘතිය හඳුනා ගැනීම

සෑම සමාජයකට ම ඊට ආවේණික වූ සංස්කෘතියක් (Culture) පවතී. ඕනෑම සමාජයක මිනිසුන්ගේ හැසිරීම්, පුරුදු, සිරිත්විරිත්, ආකල්ප, විශ්වාස ආදි සියල්ල සංස්කෘතියට අයත් වේ.

සමාජ ක්‍රමයක් තුළ පුද්ගලයන් ජීවත් වන ආකාරය ද සංස්කෘතියට අයත් ය. සංස්කෘතිය යන වචනය විවිධ පුද්ගලයන් විවිධාකාරයට නිර්වචනය කර තිබේ. ඒ සඳහා නිශ්චිත එක් නිර්වචනයක් ඉදිරිපත් කළ නොහැකිය.

අප සෑම දෙනාටම සංස්කෘතියක් තිබේ. අපේ හැසිරීම් රටාව, විවිධ පුරුදු හා ඇබ්බැහිවීම්, සිරිත්විරිත්, සිතුම්පැතුම්, විශ්වාස ආදි සියල්ල සංස්කෘතිය ලෙස සරල ව හැඳින්විය හැකි ය.

සමාජයක පවතින ආහාරපාන රටා, මංගල සහ අවමංගල චාරිත්‍ර ක්‍රම, ආගමික වත්පිළිවෙත් හා වැඳුම් පිදුම් ආදි සියල්ල සංස්කෘතියට අයත් දේවල් වේ. මෙම දේවල් වුව ද සමාජයෙන් සමාජයට වෙනස් වන තත්ත්වයක් දැක ගත හැකි ය. එම නිසා එක් සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් වෙන් වන බව ඔබ හඳුනාගත යුතු ය.

## සංස්කෘතිය පිළිබඳ ඉදිරිපත්ව ඇති නිර්වචන

සංස්කෘතිය පිළිබඳ ඉදිරිපත්ව ඇති එක් පොදු නිර්වචනයක් හඳුනා ගත නොහැක. විවිධ මානව හා සමාජ විද්‍යාඥයින් විසින් විවිධ අයුරින් එය විස්තර කර තිබේ. පහත දැක්වෙන්නේ එවැනි ප්‍රකට නිර්වචනයකි.

> දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත්විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත් වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු, ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය යි.
>
> \- ඊ. බී. ටයිලර් -

ඉහත නිර්වචනය දෙස බැලීමේ දී ඔබට පෙනී යන්නේ මිනිසාගේ සියලුම ක්‍රියාකාරකම් නැතිනම් වැඩකටයුතු සංස්කෘතිය වන බව යි. සමාජයක මිනිසුන් පිළිගත් පොදු හැසිරීම් රටාවකට හුරු පුරුදු කරනු ලබන්නේ සංස්කෘතිය මඟිනි. නැතිනම් මිනිසා හසුරුවනු ලබන, පාලනය කරනු ලබන මෙවලම සංස්කෘතිය යි. සංස්කෘතිය මඟින් මිනිසා කළ යුතු දේ සහ නොකළ යුතු දේ කියා දෙයි. ඒ සඳහා මඟ පෙන්වයි.

සංස්කෘතිය පිළිබඳව තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා පහත සංවාදය හොඳින් අධ්‍යයනය කරන්න.

නාමල්යාය මහා විද්‍යාලයේ 7 ශ්‍රේණියේ ඉගෙන ගන්නා දරුවන් රැගෙන ක්ෂේත්‍ර අධ්‍යාපන චාරිකාවක් යාමට පන්තිභාර හා විෂය භාර ගුරු මණ්ඩලය තීරණය කළ හ. මෙම ක්ෂේත්‍ර චාරිකාව අනුරාධපුරය හා පොළොන්නරුව යන ඓතිහාසික නගර දෙක කේන්ද්‍ර කර ගනිමින් දින දෙකක් පුරා සිදු කිරීමට ද සූදානම් කෙරිණ. නියමිත දින ක්ෂේත්‍ර චාරිකාව යන අතර මඟදී පන්තිභාර ගුරුතුමිය හා පන්තියේ සිසුන් කිහිපදෙනෙකු අතර ඇති වූ සංවාදයක කොටසක් පහත දැක්වේ.

දෙව්නි : අනුරාධපුර අටමස්ථානවලට ගිහින් ඒවායේ ඓතිහාසික වටිනාකම හොඳින් අවබෝධ කර ගෙන ගෙදර ඇවිත් අම්මටයි, තාත්තටයි කියලා දෙන්න කියලා මට අපේ අම්මා උදේ ගෙදරින් පිටත් වෙනකොට කිව්වා.

ජනුද : ආ.... ඇත්තද? අටමස්ථාන කියන්නේ මොනවාද කියලා අහල තිබුණට මමත් හරියට ඒ ගැන දන්නේ නැහැ. අපි ටීචර්ගෙන් අහලා බලමු.

දෙව්නි : අපිට අටමස්ථාන ගැන කියලා දෙනවා නේද ටීචර්? අනුරාධපුරයට ගියායින් පස්සේ.

ගුරුතුමිය: ඔව්... ඔව්... දරුවනේ. මම හැමෝටම අපේ චාරිකාවේ වැදගත්කම සහ නරඹන ස්ථානවල ඓතිහාසික වැදගත්කම කියලා දෙනවා. ඒවා ලියා ගන්න තමයි පොතකුයි පෑනකුයි ගේන්න කියලා කල්තියාම කිව්වේ.

අන්සාර් : ටීචර්... අපේ සංස්කෘතියට අයිති දේවල් ද ඔය අටමස්ථාන කියන්නෙ

ගුරුතුමිය: අන්න හරි... බොහොම හොඳයි... ඇහුණා නේද හැමෝටම. කල්තියාම පොතපත කියවලා කරුණු අවබෝධ කර ගෙන ඉන්නෙ අන්සාර්. අනුරාධපුරය සහ පොළොන්නරුවෙ තිබෙන සියලුම කලා නිර්මාණ, වැව් ආදි සියල්ල අපේ සංස්කෘතික අංග. ඒවා අපේ සංස්කෘතික දායාද. ඒ විතරක් නොවේ ඒවා බෞද්ධයින්ට විතරක් උරුම දේවල් නෙමෙයි. හින්දු ආගමිකයන් විසිනුත් නිර්මාණය කරපු දේවල් තියෙනවා.

දේවි : ටීචර්... මං අහලා තියෙනවා... පොළොන්නරුවෙ ශිව දේවාලය හින්දු ආගමේ නිර්මාණයක් කියලා.

ගුරුතුමිය: ඔව්... ඔව්... ශිව දේවාල හින්දු සංස්කෘතික අංග පෙන්නුම් කරන හොඳ අවස්ථාවක් බවට මතයක් පවතිනවා.

චෙනෙතු : ටීචර්... එතකොට සංස්කෘතියට අයිති වෙන්නේ ඔය ආගම්, වෙහෙර විහාර, වැව් ආදිය විතරයි ද?

ගුරුතුමිය: ඒකත් හොඳ ප්‍රශ්නයක්... බලන්න සංස්කෘතිය කියලා කියන්නේ ඔය දේවල් විතරක් නෙවෙයි. මිනිසුන්ගේ සිරිත්විරිත්... ඒ කියන්නේ අපි පුරුදු පුහුණු වෙලා තියන දේවල්, විශ්වාස, ආහාර ගන්නා ආකාරය, ඇඳුම් පැළඳුම්, කතා කරන විලාසය, හැසිරෙන ආකාරය ආදි මේ සියල්ලක් ම සංස්කෘතියට අයිතියි.

ෆාතිමා : ටීචර්... එතකොට මේ දේවල් හැම ජන කොට්ඨාසයකටම පොදුයි ද? හැම ආගමටත් පොදුයි ද?

ගුරුතුමිය: නෑ... නෑ.... ඔයගොල්ලො හොඳින් තේරුම් ගන්න ඕන මේක තමයි. හැම ජන කොට්ඨාසයකටම, හැම ආගමකටම සංස්කෘතියක් තියෙනවා. හැබැයි ඒ සංස්කෘතිය එකිනෙකට වෙනස්. ඒ වුණත් සමහර සංස්කෘතික අංග අපි හැමෝටම පොදුයි. මොනවද කියල දන්නවද ඒ පොදු දේවල්.

ජනුද : මං දන්නවා ටීචර්...

ගුරුතුමිය: හා... හොඳයි... කියන්න බලන්න එහෙනම් ජනුද පුතා.

ජනුද : භාෂාව, ආගම, කලා ශිල්ප, ඇඳුම් පැලඳුම්, සිරිත්විරිත්

දෙව්නි : ටීචර්, ඒ දේවල් පොදු වුණාට... ජන වර්ගයෙන් ජන වර්ගයට වගේම ආගමෙන් ආගමටත් ඒ දේවල් සිදු කරන විදිහෙ වෙනසක් තියෙනවා නේද?

ගුරුතුමිය: ඔව්... ඔව්... හොඳයි දෙව්නි ඔයාගෙ ඒ අදහස පැහැදිලි කරන්නකො අනෙක් යාළුවන්ටත් හොඳට තේරෙන විදිහට.

දෙව්නි : දැන් බලන්නකො... අපි හැමෝටම පොදුයි ඇඳුම් පැලඳුම්. හැබැයි සිංහල අය ඔසරියයි සාරියයි දෙකම අඳිනවා. දෙමළ අය සාරිය අඳිනවා. මුස්ලිම් කාන්තාවන් සාරිය ඇඳලා ෆර්දාවත් දානවා. ඒකයි මං කිව්වේ පොදු ලක්ෂණ තිබුණත් ඒ අතර පවා යම් යම් වෙනස්කම් පවතින බව.

ගුරුතුමිය: ආ... බොහොම හොඳයි... දෙව්නි දුව හොඳ උදාහරණයක් අරගෙන ඒ පැහැදිලි කිරීම කළේ. තාමත් තේරෙන්නෙ නැති අය ඇති නේද? ඒක.. මං කියලා දෙන්නම්කො.. ඔයගොල්ලන්ට තවදුරටත් ඔය ගැන තොරතුරු. අපිට සංස්කෘතියක් තියෙනවා. ඒ සංස්කෘතිය ජන වර්ගයෙන් ජන වර්ගයට වෙනස් වෙනවා. ඒ වගේම ආගමෙන් ආගමටත් වෙනස් වෙනවා. සමහර විට ප්‍රදේශයෙන් ප්‍රදේශයට, සමාජයෙන් සමාජයටත් වෙනස්කම් ඇති වෙන්න පුළුවනි. මේ නිසා තමන්ට උරුම වූ සංස්කෘතිය අපි හඳුන්වන්නේ සංස්කෘතික අනන්‍යතාව කියලා. පැහැදිලියි නේද හැමෝටම. සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගන්න සෑම අයෙක්ම කටයුතු කරනවා. ඒක හොඳ දෙයක්. දැන් ඔගොල්ලො දන්නවා නේද එහෙනම් සංස්කෘතික අංග මොනවද කියලා. ඒ වගේම සංස්කෘතික අනන්‍යතාව

කියන්නේ මොකක්ද කියලත් දන්නවා නේද? එහෙනම් ඔන්න මං පුංචි ප්‍රශ්නයක් ඔය ගොල්ලන්ගෙන් අහනවා.

ෆාතිමා : ටීචර්... ගෙදර වැඩක් ද?

ගුරුතුමිය: නෑ... නෑ... දැන්ම මට කියන්න ඕනෙ... මුලින්ම කියපු කෙනාට අපි හොඳ අත්පොළසන් නාදයක් දෙනවා. මෙන්න එහෙනම් ප්‍රශ්නය... සංස්කෘතිය කියන්නෙ මොකක්ද කියලා සරලව නිර්වචනයක් හදලා හයියෙන් කියන්නකො අපි හැමෝටම ඇහෙන්න.


චෙනෙතු : ටීචර්... සංස්කෘතිය කියන්නේ අපි කන බොන, අඳින පලඳින, කතා කරන, හැසිරෙන, වැඳුම් පිදුම් කරන ඒ විතරක් නෙමෙයි කලා ශිල්ප, සිරිත්විරිත් ආදි සියල්ලටම...

ගුරුතුමිය: බොහොම හොඳයි... බොහොම හොඳයි... මං හිතුවටත් වඩා සාර්ථක උත්තරයක්නෙ දුන්නේ... දැන් තේරුණා නේද? අනිත් අයත් තමන්ගේ නිර්වචනය හොඳින් හිතේ තියාගෙන තමන්ගෙ වැඩ පොතේ පසුව ලියා ගන්න ඕනෙ.

**සංස්කෘතික අංග** (Elements of Culture)

සෑම සමාජයකම පැවැත්ම සඳහා සංස්කෘතිය මඟින් ඉටු කරනු ලබන මෙහෙය අතිශය වැදගත් වේ. එසේම කාලයෙන් කාලයට සංස්කෘතිය විවිධ වෙනස්කම්වලට ලක්වන ආකාරය ද හඳුනාගත හැකි ය. සමාජයෙන් සමාජයට සංස්කෘතිය වෙනස් වේ. එම නිසා එක් එක් සංස්කෘතියට ආවේණික වූ සුවිශේෂ සංස්කෘතික ලක්ෂණ පවතී.

කෙසේ වුවද සෑම සංස්කෘතියකම දක්නට ලැබෙන සංස්කෘතික අංග රාශියක් වේ. වරින් වර ඒවා වෙනස් විය හැකි ය. භාෂාව, ආගම, සාහිත්‍යය, ඇඳුම් පැලඳුම් ආදි දේවල් සංස්කෘතික අංග කිහිපයක් සඳහා නිදසුන් වේ. පහත දැක්වෙන රූප සටහන තවදුරටත් අධ්‍යයනය කිරීමෙන් ඔබට සංස්කෘතික අංග පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගත හැකි ය.




**ක්‍රියාකාරකම 3.1**

- සංස්කෘතිය ලෙස ඔබ තේරුම් ගත් දෑ ඇසුරින් සරල නිර්වචනයක් නිර්මාණය කරන්න.
- සංස්කෘතික අංග තුනක් නම් කරන්න. ඒවාට නිදසුන් එක බැගින් සපයන්න.

## සෑම සංස්කෘතියකම දක්නට ලැබෙන පොදු ලක්ෂණ

සමාජයෙන් සමාජයට සංස්කෘතිය වෙනස් විය හැකි ය. එම නිසා එක් සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් වෙනස් වේ. එසේ වෙනස් වුවද ඒ සෑම සංස්කෘතියකටම පොදු වූ ලක්ෂණ රාශියක් ද පවතී. නිදසුනක් ලෙස භාෂාව, ආගම, සිරිත්විරිත් සෑම සංස්කෘතියකටම පොදු සංස්කෘතික අංග වේ. විශේෂයෙන් බහු සංස්කෘතික ජන සමාජයක සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමේ දී එක් එක් සංස්කෘතියට සුවිශේෂ වූ සංස්කෘතික ලක්ෂණ මෙන් ම පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ ද හඳුනා ගැනීම වැදගත් වේ. පහත රූප සටහන හොඳින් අධ්‍යයන කිරීම තුළින් සෑම සංස්කෘතියකටම පොදු අංග ලක්ෂණ මොනවාද යන්න පිළිබඳ අවබෝධ කර ගත හැකි ය.

උදා:-

| | |
|---|---|
| අධ්‍යාපනය | සංස්කෘතිය පවරා දීම |
| සිරිත්විරිත් | වැඩිහිටියන්ට සැලකීම |
| ආහාර පාන | බත්, එළවළු, පලතුරු |

## එක් එක් සංස්කෘතියට අනන්‍ය වූ ලක්ෂණ

සෑම සංස්කෘතියකටම පොදු ලක්ෂණ පවතින බව ඔබ මේ වන විට ඉගෙන ගෙන ඇත. ඊට ආවේණික වූ ලක්ෂණ ද දක්නට ලැබේ. නැතිනම් එක් එක් සංස්කෘතියට උරුම වූ, ඊට ආවේණික වූ ලක්ෂණ හඳුනාගත හැකි ය. එලෙස විවිධ සංස්කෘතීන් අතර වෙනස්කම් ඇති වීම සඳහා බලපාන සාධක වන්නේ ජනවර්ග, ආගම්, භාෂා, ජීවනෝපාය ක්‍රම ආදි කරුණු ය. නිදසුන් ලෙස ශ්‍රී ලාංකික ජන සමාජය සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ ආදි ජනවර්ග රාශියකින් සමන්විත වේ. එම සෑම ජනවර්ගයකටම එයට ආවේණික සංස්කෘතියක් හා සංස්කෘතික ලක්ෂණ ද දක්නට ලැබීම පෙන්වා දිය හැකි ය.

## සංස්කෘතික විවිධත්වයට හේතු

- ජනවර්ගය (Ethnicity)
- ආගම (Religion)
- භාෂාව (Language)
- ජීවනෝපාය මාර්ග (Occupation)

ජනවර්ගය, ආගම, භාෂාව, ජීවනෝපාය මාර්ගය ආදි සාධක පදනම් කරගෙන එක් සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් වෙනස් වේ. එම සාධක පදනම් කරගෙන සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් වෙන්ව හඳුනා ගැනීමට හැකි වීම සංස්කෘතික අනන්‍යතාව ලෙස හැඳින්වේ.

බහු සංස්කෘතික සමාජයක ජීවත් වීමේ දී මෙම සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීම ඉතා වැදගත් ය. එසේම විවිධ සංස්කෘතිවලට අයත් ලක්ෂණ හඳුනා ගෙන ඒවාට ගෞරව කිරීම මෙන්ම හෙළා නොදැකීම ද අතිශය වැදගත් වේ. එවිට සංස්කෘති අතර ශක්තිමත් අන්තර් සම්බන්ධතාවක් ගොඩනැගෙයි. එමගින් සමාජයේ සහජීවනය, සහෝදරත්වය, සමානාත්මතාව, සමගිය මෙන්ම සාමය ද ඇති වේ.

## ශ්‍රී ලාංකික ජන සමාජයේ සංස්කෘතික විවිධත්වය


ශ්‍රී ලාංකික ජන සමාජය බහු සංස්කෘතික ජන සමාජයක් (Multi - cultural society) සඳහා දිය හැකි හොඳම නිදසුනකි. අප රට තුළ සිංහල, දෙමළ, මුස්ලිම් යන ප්‍රධාන ජනවර්ග තුන සහෝදරත්වයෙන් යුතුව සියවස් ගණනාවක් තිස්සේ එක්ව ජීවත් වෙති. ඊට අමතරව බර්ගර් හා මැලේ වැනි වෙනත් ජනවාර්ගික කණ්ඩායම් ද මනා සහෝදරත්වයකින් යුතුව ශ්‍රී ලාංකික ප්‍රජාවක් ලෙස එක්ව කටයුතු කරති.


ආගම් වශයෙන් ගත් විට බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කතෝලික/ක්‍රිස්තියානි යන ආගම් හතරට අයත් ජන කොටස් එක්ව ජීවත් වෙති. ආගමික සහජීවනය මනාව ආරක්ෂා වී පවතී. බොහෝ ආගමික ස්ථාන සෑම ආගමකටම අයත් කණ්ඩායම්වල පූජනීය ස්ථාන බවට පත්වීම සුවිශේෂ තත්ත්වයකි. නිදසුනක් ලෙස කතරගම දේවාලය, නල්ලූර් කෝවිල, මඩු පල්ලිය, තලවිල ශාන්ත ආනා දෙව්මැදුර, ශ්‍රී පාදස්ථානය එවැනි පූජනීය ස්ථාන අතුරින් කිහිපයකි.


භාෂාව ගත් විට සිංහල සහ දෙමළ අප රටේ පවතින ප්‍රධාන භාෂා දෙක වේ. සිංහල දරුවන් දෙමළ භාෂාවත්, දෙමළ දරුවන් සිංහල භාෂාවත් හසුරුවන ආකාරය වර්තමානයේ අපේ පාසල් ආශ්‍රිතව දැකගත හැකි ය. එය ඉතා යහපත් ලක්ෂණයක් මෙන්ම අගය කළ යුතු දෙයකි. මීට අමතරව ජාත්‍යන්තර භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව රටේ සෑම ජන කොටසක් ම පොදුවේ භාවිත කරති. අපි සෑම අයෙක්ම තම මව් භාෂාව පමණක් නොව රටේ භාවිත කරනු ලබන අනෙක් භාෂා ද කතා කිරීමට, ලිවීමට හුරුවක් ඇති කර ගැනීම අතිශය වැදගත් වේ.


මෙලෙස අප රට තුළ විවිධ ජන වර්ග, ආගමික කණ්ඩායම් සහ භාෂා පැවතීම නිසා බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ දක්නට ලැබේ. එවැනි බහු සංස්කෘතික ජන සමාජයක සාමකාමීව සහ සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ඔබ සියලුදෙනා කැපවීමෙන් ක්‍රියා කළ යුතු ය.

## ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින බහු සංස්කෘතික ලක්ෂණ



## විවිධ ආගම් හා ජනවර්ගවලට ආවේණික ලක්ෂණ

ආගම් හා ජනවර්ගවලට ආවේණික සංස්කෘතික අංග ලක්ෂණ හඳුනා ගත හැකි ය. භාෂා, ආගම්, ඇඳුම් පැළඳුම්, කලා ශිල්ප, අධ්‍යාපනය ආදිය සෑම සංස්කෘතියකටම පොදු ලක්ෂණ වේ. එහෙත් එක් එක් ජනවර්ග මෙන්ම ආගම අනුව ද එම සංස්කෘතික අංග වෙනස් වේ. එම එක් එක් ආගමට අයත් සංස්කෘතික උත්සව ද විවිධාකාර ස්වරූපයක් ගනු ලැබේ. පහත දැක්වෙන්නේ එක් එක් ජනවර්ගවලට හා ආගම්වලට අයත් උත්සව අවස්ථා සඳහා නිදසුන් කිහිපයකි.



3.1 රූපය - සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය



3.2 රූපය - තෛපොංගල් උත්සවය





3.3 රූපය - වෙසක් / පොසොන් උත්සව



3.4 රූපය - කතෝලික ආගමික උත්සවය



3.5 රූපය - හජ්ජි උත්සවය



3.6 රූපය - නත්තල් උත්සවය

එක් එක් ආගමට හා ජනවර්ගයට අයත් සාමාජිකයන් අනුගමනය කරන වෙනත් සංස්කෘතික උත්සව අවස්ථා රාශියක් ද වේ. නිදසුන් ලෙස විවාහ මංගල හා අවමංගල්‍ය අවස්ථා, දරුවකුගේ ඉඳුල් කටගෑමේ උත්සවය, හිසකෙස් කැපීමේ චාරිත්‍රය, නව නිවසකට ගෙවදීමේ අවස්ථා ආදිය දැක්විය හැකි ය. එම සංස්කෘතික උත්සවවල දී අනුගමනය කරන සිරිත්විරිත් ජනවර්ගයෙන් ජනවර්ගයට වෙනස් වේ. එමෙන්ම ආගමෙන් ආගමට ද වෙනස් විය හැකි ය. විවාහ මංගල උත්සව, අවමංගල උත්සව ආදියේ දී අනුග මනය කරන සිරිත්විරිත් එක් එක් සංස්කෘතිය අනුව වෙනස් වේ.

## සංස්කෘතික දායාද (Cultural Heritage)

සෑම සංස්කෘතියකටම අයත් වූ සංස්කෘතික අංග පවතින අතර ඒවා ආරක්ෂා කොට අනාගත පරම්පරාව වෙත පවරා දීම කළ යුතු ය. සෑම සංස්කෘතියකටම අයත් අංග සංස්කෘතික දායාද ලෙස හැඳින්වේ. නිදසුනක්

ලෙස සිරිත්විරිත්, කලා ශිල්ප ආදිය දැක්විය හැකි ය. එම සංස්කෘතික දායාද ආරක්ෂා කරමින් පවත්වාගෙන යාම මෙන්ම අනාගත පරම්පරාව වෙත පවරා දීම සැම දෙනාගේම යුතුකම හා වගකීම වේ.

සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම අතිශය වැදගත් වේ. සංස්කෘතියක අඛණ්ඩ පැවැත්ම තහවුරු වීම සඳහා සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම කළ යුතුය. අතීත උරුමයන් පිළිබඳ අභිමානය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබෙන්නේ සංස්කෘතික දායාද ආරක්ෂා කර ගතහොත් පමණි. එමගින් තමන්ගේ සංස්කෘතියේ පවතින සුවිශේෂී බව, අනන්‍යතාව ආරක්ෂා කොට පවත්වාගෙන යාමට හැකිවේ. විශේෂයෙන්ම රටක ජනවාර්ගික, භාෂා සහ ආගමික කණ්ඩායම්වලට සුවිශේෂ වූ අනන්‍යතාවක් පවතී. එම අනන්‍යතාව තවදුරටත් ආරක්ෂා කොට ඉදිරියට පවත්වාගෙන යා හැකි වන්නේ සංස්කෘතික දායාද අරක්ෂා කොට අනාගතය සඳහා පවරා දෙනු ලැබුවහොත් පමණි. වෙනත් සංස්කෘතීන්ට ගරු කිරීම, ඒවායේ සිරිත්විරිත්, චාරිත්‍ර විධි, කලා ශිල්ප ආදි ලක්ෂණවලට ගරු කිරීමට පුරුදු පුහුණු වන්නේ සංස්කෘතික දායාද ආරක්ෂා කර ගතහොත් පමණි. බහු සංස්කෘතික ජන සමාජයක යහපත් පුරවැසියකු වශයෙන් කටයුතු කිරීමේ දී වෙනත් සංස්කෘතීන්ට මෙන්ම සංස්කෘතික දායාදවලට ගරු කිරීම, ආරක්ෂා කිරීම සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා අතිශය වැදගත් වේ.

**ක්‍රියාකාරකම 3.2**

- ශ්‍රී ලාංකික සමාජය තුළ දක්නට ලැබෙන සංස්කෘතික දායාද කිහිපයක් පිළිබඳ තොරතුරු එක් රැස් කරන්න.
- ඒවා ජනවාර්ගික, ආගමික හා භාෂා වශයෙන් වෙන් කොට එම දායාද අරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳ හේතු පාඨයක් ගොඩනගන්න.
- එය පන්තියේ ප්‍රදර්ශන පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.

## සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

සැම සංස්කෘතියකටම අයත් සංස්කෘතික දායාද, උරුම ආරක්ෂා කර ගැනීම සැම පුරවැසියෙකුගේම යුතුකමක් මෙන් ම වගකීමක් ද වේ. සංස්කෘතික දායාද, උරුම ආරක්ෂා කොට පවත්වා ගෙන යාම මගින් අනාගත පරපුර

වෙත සංස්කෘතිය පවරා දීමට අවස්ථාව උදා වේ. එසේම තම සංස්කෘතික අනන්‍යතාව පිළිබඳ ආඩම්බරයක් මෙන් ම අභිමානයක් ද ඇති වේ. නිදසුනක් ලෙස අනුරාධපුරය, පොලොන්නරුව ආදි ඓතිහාසික ප්‍රදේශවල පවතින වෙහෙර විහාර, දාගැබ්, වැව් අමුණු ආදි සංස්කෘතික අංග මඟින් ශ්‍රී ලාංකික සංස්කෘතියේ අභිමානය ලොවට කියාපෑම පෙන්වා දිය හැකි ය.

සෑම සංස්කෘතියකටම සුවිශේෂ වූ සංස්කෘතික දායාද පවතී. එම සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම අප සෑම දෙනාගේම යුතුකමක් මෙන් ම වගකීමක් වනු ඇත. සංස්කෘතික දායාද අරක්ෂා කර ගැනීම අනාගත පරපුර වෙනුවෙන් සංස්කෘතිය පවරා දීමට ඉවහල් වේ.

සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා පුරවැසියෙකු වශයෙන් අපට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග රාශියක් වේ. ඉන් කිහිපයක් නම්,

- සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමේ වටිනාකම පිළිබඳව සමාජය දැනුවත් කිරීම.
- සංස්කෘතික දායාදවලට හානි කරන ක්‍රියාකාරකම්වලින් වැළකීම සහ එලෙස හානි කරන අය වේ නම් ඔවුන් ඉන් මුදවා ගැනීමට කටයුතු කිරීම.
- සංස්කෘතික දායාදවලට හානිවන අවස්ථා වේ නම් ඒ පිළිබඳව අදාළ ආයතන දැනුවත් කිරීම. උදා :- පොලීසිය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආදි ආයතන

**ක්‍රියාකාරකම 3.3**

- සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳ කෙටි රචනාවක් ලියා බිත්ති පුවත් පතක ප්‍රදර්ශනය කරන්න.



3.7 රූපය - ගල්විහාර පිළිමය



3.8 රූපය - සඳකඩපහණ



3.9 රූපය - නෙලුම් පොකුණ



3.10 රූපය - පරාක්‍රම සමුද්‍රය



3.11 රූපය - සමාධි පිළිමය



3.12 රූපය - සීගිරිය



3.13 රූපය - කතරගම දේවාලය




3.14 රූපය - මඩු පල්ලිය



3.15 රූපය - කොළඹ දවටගහ මුස්ලිම් පල්ලිය



3.16 රූපය - යාපනය නල්ලූර් කෝවිල

සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා නීතිමය වශයෙන් මෙන් ම සදාචාරාත්මක බැඳීමක් අප සෑමදෙනා වෙතම පවතී. එය නිතැතින් ම අප තුළ වර්ධනය විය යුතු දෙයක් මිස ආයාසයෙන් ඇති කළ යුත්තක් නොවේ. පුරාවිද්‍යාත්මක මෙන්ම භෞතික වටිනාකමකින් යුත් සංස්කෘතික දායාද තම ලාභ ප්‍රයෝජන වෙනුවෙන් විනාශ නොකර ආරක්ෂා කර ගැනීම සඳහා අදිටන් කර ගැනීම කළ යුතු ය. එසේම විවිධ පුද්ගලයන්ගෙන් සිදුවන හානි වළක්වා ගැනීම සඳහා නීතිරීති ආදිය පනවා ඇත්තේ ඒවායේ ඇති පුරාවිද්‍යාත්මක වටිනාකම හේතුවෙනි. විශේෂයෙන්ම යම් යම් පුද්ගලයින් විසින් ක්ෂණික ලාභ අපේක්ෂාවෙන් වටිනා සංස්කෘතික දායාද විනාශ කර ඇති අවස්ථා කොතෙකුත් ඔබ පුවත්පත්, රූපවාහිනී ආදි ජනමාධ්‍ය ඔස්සේ

දැක තිබෙන්නට පුළුවන. එවැනි පුද්ගලයන්ට එරෙහිව හඬක් නැගීම අප සැමගේ යුතුකමක් හා වගකීමක් වනු ඇත. එවැනි නොමනා ක්‍රියාකාරකම් තුළින් සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා අපට නීතිමය වශයෙන් මැදිහත් විය හැකි ය.

බොහෝ සංස්කෘතික දායාද ලෝක උරුම ලෙස පිළිගැනීමට ලක් ව ඇත. එම නිසා ඒවා ආරක්ෂා කර නොගතහොත් අනාගත පරම්පරාවට එම දායාද අහිමි වනු ඇත. එම නිසා අප සියලුදෙනාම සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා සදාචාරාත්මක වශයෙන් ද බැඳී සිටින බව අමතක නොකළ යුතු ය. නීතිමය බැඳීම මෙන්ම සදාචාරාත්මක බැඳීම ද අතිශය වැදගත් වේ.

## පවුල මඟින් සංස්කෘතිය පවරාදීම

එක් පරම්පරාවකින් තවත් පරම්පරාවක් වෙත සංස්කෘතිය පවරා දීම සිදු කරනු ලබන මූලිකම ඒකකය පවුලයි. පවතින සංස්කෘතික අංග තවත් පරම්පරාවක් වෙත දායාද කරනු ලබන්නේ පවුල විසිනි. මව, පියා, වැඩිහිටි සහෝදර සහෝදරියන්, ආච්චි, සීයා සහ ඥාතීන් විසින් සංස්කෘතිය පවරා දීම සිදු කරනු ලබයි. එම අය සංස්කෘතිය පවරා දෙන්නෝ වෙති.

නිදසුනක් ලෙස, සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය තුළ නැකතට ලිප ගිනි මෙළවීම හා කිරි ඉතිරවීම, ගනුදෙනු කිරීම, ආහාර අනුභවය, මෙන් ම හිසතෙල් ගෑම වැනි චාරිත්‍ර වැඩිහිටියන් විසින් තම දරුවන් ඉදිරියේ සිදු කිරීම පෙන්වා දිය හැකි ය. එම සිරිත් ඒ ආකාරයෙන් ම ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා දරුවන් ද ක්‍රියා කරනු ඇත. මේ ආකාරයට සංස්කෘතිය පවරා දීම කෙරෙහි ඍජු ලෙසම තම පවුල දායක වනු ඇත. එය දෙමව්පියන් සතු යුතුකමකි. ඊට අමතරව පාසල, ආගමික ස්ථාන, වැඩිහිටියන් සහ අසල්වාසීන් ද සංස්කෘතිය පවරා දීම සඳහා දායක වන්නෝ වෙති.



3.17 රූපය - කිරි ඉතිරවීම



3.18 රූපය - ළිඳ සමග ගනුදෙනු කිරීම



3.19 රූපය - ආහාර අනුභවය



3.20 රූපය - හිස තෙල් ගෑම

### ක්‍රියාකාරකම 3.4

- සංස්කෘතිය පවරා දීම පවුලේ ප්‍රධාන කාර්යයයි. ඔබට පවුලෙන් ලැබුණු සංස්කෘතික දායාද කිහිපයක් මතකයට නගා ගන්න.
- ළඟ සිටින ඔබේ මිතුරා සමඟ ඒවා සාකච්ඡා කරන්න.
- ඉන් කිහිපයක් පොතේ පිටපත් කර ගන්න.

**ක්‍රියාකාරකම 3.5**

- තම සංස්කෘතියට අයත් සංස්කෘතික උරුමයන් කිහිපයක් නම් කරන්න.
- ඒ අතුරින් ඔබ වඩාත් කැමති සංස්කෘතික උරුමයන් දෙකක් පිළිබඳ විස්තර රැස් කරන්න.

## සංස්කෘතිය ආරක්ෂා කිරීමේ වැදගත්කම

සංස්කෘතිය ආරක්ෂා කොට පවත්වාගෙන යාම සඳහා සෑම ජන කණ්ඩායමක්, භාෂා හා ආගමික කණ්ඩායමක්ම උත්සාහ දරති. එමගින් සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කොට පවත්වාගෙන යාමට ඔවුන්ට හැකියාව ලැබේ. එමගින් රටක ජාතික අනන්‍යතාව මෙන් ම ජාතියේ අභිමානය ආරක්ෂා වනු ඇත. නිදසුනක් ලෙස "ශ්‍රී ලාංකික ජාතිය" යන අනන්‍යතාව ලොවට හඬගා කීමට මෙරට සංස්කෘතිය දායක වීම පෙන්වා දිය හැකි ය. වැව් බැඳි ශිෂ්ටාචාරය, දාගැබ් හා වෙහෙර විහාර, කෘෂි කර්මාන්තය හා බැඳුනු ජන ජීවිතය, ආගමික සිරිත්විරිත් ආදිය ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කරනු ලබන කදිම සාධක වෙති.



3.21 රූපය - වාරි කර්මාන්ත



3.22 රූපය - රුවන්වැලි මහා සෑය



නොමිලේ බෙදාහැරීම සඳහා ය.



3.23 රූපය - හින්දු කෝවිල



3.24 රූපය - කතෝලික පල්ලිය

එසේම ජාතික සමගිය ගොඩනැගීම සඳහා තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගන්නා අතරම අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම හා ඒවා ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම ද ඉතා වැදගත් වේ. එවිට සෑම සංස්කෘතික කණ්ඩායමක් අතරම සුහදතාව හා විශ්වාසය වර්ධනය වේ. එය ජාතික සමගිය ගොඩනැගීමට උපකාරී වනු ඇත. විශේෂයෙන්ම "ශ්‍රී ලාංකික" යන හැඟීම ඇති වීම කෙරෙහි එය මහත්සේ උපකාරී වේ.

බහු සංස්කෘතික ජන සමාජයක සියලුම සංස්කෘතීන්ට අයත් සංස්කෘතික දායාද, සංස්කෘතික උරුම සුරකිමින් සහජීවනයෙන් කටයුතු කිරීම ජාතික අභිමානය වර්ධනය වීමට හේතු වේ.

## ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත

වර්තමානයේ ලොව බොහෝ රාජ්‍ය බහු සංස්කෘතික සමාජ වේ. බහු සංස්කෘතික සමාජයක් යන්නෙන් අදහස් කරනු ලබන්නේ එකම රටක් තුළ විවිධ වාර්ගික, ආගමික සහ භාෂාමය කණ්ඩායම් රාශියක් ජීවත් වන සමාජ ක්‍රමයක් බව ඔබ මේ වන විට ඉගෙන ගෙන ඇත. එවැනි සමාජ ක්‍රමවල එක් එක් කණ්ඩායමට සුවිශේෂ වූ අනන්‍යතාවක් පවතින අතර එය ආරක්ෂා කර ගැනීම අත්‍යවශ්‍ය වේ. එසේ නොවුණහොත් එම කණ්ඩායම් අතර ගැටුම් ඇතිවීමට ඉඩ තිබේ.

බහු සංස්කෘතික ජන සමාජයක සියලු පුරවැසියන් ජාතියක් වශයෙන් එක්සත්ව, සාමූහිකව සහ සමාජ ඒකාබද්ධතාවකින් යුතුව කටයුතු කිරීම ජාතික අනන්‍යතාව ගොඩනැගීම කෙරෙහි අතිශය වැදගත් වේ.

නිදසුනක් ලෙස ශ්‍රී ලාංකික ජන සමාජයේ සිංහල, දෙමළ, මුස්ලිම් ජන කණ්ඩායම් මෙන්ම, බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ කතෝලික ආගමික

කණ්ඩායම් ද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා කතා කරන කණ්ඩායම් ද "ශ්‍රී ලාංකික" යන හැඟීමෙන් යුතුව කටයුතු කිරීම ජාතික අනන්‍යතාව වේ.

ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව පෙන්නුම් කරන සංකේත ලෙස ජාතික කොඩිය, ජාතික ගීය, රාජ්‍ය ලාංඡනය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය, ජාතික පක්ෂියා සහ ජාතික ක්‍රීඩාව වැදගත් වේ. මීළඟට එම ජාතික සංකේත පිළිබඳ අධ්‍යයනය කරමු.

## ජාතික කොඩිය (National Flag)

රටක ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත අතුරින් ජාතික කොඩිය සුවිශේෂ වේ. ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය, ශ්‍රී වික්‍රම රාජසිංහ රජු භාවිත කළ පැරණි රාජකීය කොඩිය ඇසුරින් නිර්මාණය කර ඇත. දැනට අප රටේ භාවිත කරන ජාතික කොඩිය "සිංහ කොඩිය" ලෙස ද හඳුන්වයි.



**3.25 රූපය - ජාතික කොඩිය**

1948 මාර්තු 06 දින එවකට ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා පත් කළ කොඩි කමිටුවේ නිර්දේශය පරිදි වර්තමාන ජාතික කොඩිය නිර්මාණය කර තිබේ. ජාතික කොඩි කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කර ඇත්තේ,

- එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා (කමිටු සභාපති)
- සර් ජෝන් කොතලාවල මැතිතුමා

- ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා
- ටී. බී. ජයා මැතිතුමා
- ආචාර්ය එල්. ඒ. රාජපක්ෂ මැතිතුමා
- ජී. ජී. පොන්නම්බලම් මැතිතුමා
- සෙනෙට් සභික නඩේසන් මැතිතුමා
- ආචාර්ය සෙනරත් පරණවිතාන මැතිතුමා (කමිටු ලේකම්)

කොඩි කමිටුවේ යෝජනා අනුව සකස් කරන ලද ජාතික කොඩිය 1951 මාර්තු 02 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. 1951 මාර්තු 31 වන දා පැරණි පාර්ලිමේන්තුව ඉදිරිපිට ප්‍රධාන කොඩි ගසෙහි එම ජාතික කොඩිය ඔසවා ඇත. 1972 දී ජාතික කොඩියේ මුලු හතරේ තිබූ පැරණි බෝපත් හතර ඉවත් කර වර්තමානයේ පවතින බෝපත් හතර එකතු කර ඇත.

**ජාතික කොඩියේ සංකේත මගින් නිරූපණය වන්නේ**

**කහපාට සිංහයා** - සිංහල ජාතිය, සිංහල ජනතාවගේ විනයගරුක බව, නිර්භීතකම, අභිමානය හා නායකත්වය, සාධාරණත්වය

**දකුණතින් ඔසවාගත් කහපැහැ අසිපත** - ධාර්මිකව, නීත්‍යානුකූලව, යුක්ති ගරුකව රට පාලනය කරමින් මව්බිම ආරක්ෂා කිරීම

**රතු පසුබිමේ සිව්කොන බෝපත් හතර** - මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ ඇතුළු සියලු ආගම්වලට ගරු කිරීමේ උතුම් ගුණාංග

**තද රතුපාට පසුබිම** - ශ්‍රී ලාංකික සියලු ජනතාවගේ ජීව රුධිරය සහ පැරණි සිංහල රාජකීය ධජයේ නියෝජනය

**කොඩියේ වම් පස කොළ සහ තැඹිලි පැහැති තීරු** - තැඹිලි පාට තීරුවෙන් දෙමළ ජනවර්ගයත්, කොළපාට තීරුවෙන් මුස්ලිම් (Moor) ජන වර්ගයත් නියෝජනය

**කොඩිය වටේ ඇති එක සමාන පළලකින් යුත් කහ පැහැති තීරුව** - සියලු ජාතීන් අතර එකමුතුකම, සාමය, ප්‍රඥාව, එකිනෙකා අතර අවබෝධය

**සිංහයාගේ හිසේ කේශර හා වලිගයේ නැවුනු ඉහළ කොටස** - පාලකයා හා රටවැසියන් අතර සමානාත්මතාව පැවතීම

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන අනු ව්‍යවස්ථාව තුළ ජාතික කොඩිය පිළිබඳ සඳහන් වන අතර එය දෙවන උප ලේඛනයෙහි නිරූපණය කර තිබේ.

> "ශ්‍රී ලංකා ජන රජයේ ජාතික කොඩිය දෙවන උප ලේඛනයෙහි නිරූපිත සිංහ කොඩිය වන්නේ ය"

අපි රටේ වර්තමාන ජාතික කොඩියෙහි ප්‍රමිතිය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සකස් කර ඇත. ජාතික කොඩියේ නිවැරදි සැලැස්ම, ප්‍රමාණය හා වර්ණය යනාදිය එයට ඇතුළත් වේ. එස්.එල්.එස් 693: 1985 දරන ශ්‍රී ලංකා ජාතික කොඩිය සඳහා වූ ප්‍රමිති පිරිවිතරෙහි එම තොරතුරු ඇතුළත් වේ.

### ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා

- රාජ්‍ය උත්සව අවස්ථාවල
- ජාතික උත්සවවල
- රාජ්‍ය නායක සමුළුවල
- පාසලක හෝ ආයතනයක වැදගත් උත්සව අවස්ථාවක
- වෙනත් විශේෂ උත්සව අවස්ථාවල

### ජාතික කොඩිය ප්‍රදර්ශනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- පැහැදිලිව පෙනෙන ස්ථානයක ඔසවා තැබීම
- සිරස් වර්ණ තීරු දෙක කොඩි ගස දෙසින් සිටින පරිදි ඔසවා තැබීම
- සෑම උත්සවයකදීම එයට ප්‍රමුඛතාව ලබා දීම
- වෙනත් රටවල ජාතික කොඩි සමඟ ඔසවා තබන විට සමාන උසකින් තැබීම / ශ්‍රී ලංකා ජාතික කොඩියට වම් පසින් තැබීම/ සෑම ජාතික කොඩියක්ම එක සමාන ප්‍රමාණයකින් යුක්ත වීම
- රාත්‍රී කාලයේ දී ඔසවා තබන්නේ නම් විදුලි ආලෝකය ලැබීමට සැලැස්වීම

- ප්‍රාදේශීය කොඩි, සමිති, පාසල්, සංගම් ආදියෙහි කොඩි සමඟ ඔසවා තබන විට කොඩි සියල්ලට මැදින් තැබීම හා ඉහළම ස්ථානයේ ඔසවා තැබීම


- එකිනෙකට ළංව ඇති කොඩි කණු කිහිපයක කොඩි එල්ලනු ලබන විට පළමුව එසවීම හා අවසානයේ පහත් කිරීම

- වීදියක් මැද ප්‍රදර්ශනය කරන විට සිංහයා පොළවට ඍජුව සිටින සේ තිරස් අතට කොඩිය දිග පැත්තෙන් එල්ලීම


- පෙරහැරක ගෙන යන විට පෙළපාලියේ දකුණු පසින් ගෙන යාම හා වෙනත් කොඩි සමඟ ගෙන යන විට කොඩි පෙළේ මැදට ඉදිරියෙන් ගෙන යාම



ජාතික කොඩිය එසවීම



වීදියක් මැද එසවීම



$45^0$ කෝණයකින් එසවීම

3.26 රූපය - උපුටා ගැනීම : ජාතික කොඩිය භාවිතය රීති සංග්‍රහය (1987) පි. 29,34,35

## උත්සවයක ජාතික කොඩිය එසවීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු රීති

- එසවීමට පෙර යොතට සවිකර හකුලා උස් ස්ථානයක තැබීම

- කොඩිය ඔසවන්නා සීරුවෙන් සිට එසවීම හා අනෙක් සියලු දෙනා නැගිට කොඩියට මුහුණලා සීරුවෙන් සිටීම

- එසවීම හා පහත් කිරීම සෙමෙන් හා ගෞරවාන්විතව කිරීම

- ඔසවන විට හැකි සෑම අවස්ථාවකදීම මඟුල් බෙර වැයීම හා ශංඛ නාද පැවැත්වීම
- ඔසවා අවසන් වී සියලු දෙනා සීරුවෙන් සිට ගැනීමෙන් පසු ජාතික ගීය ගායනය

## ජාතික කොඩිය අඩකුඹු කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු රීති

- රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති ජාතික ශෝක දිනයන්හි පමණක් අඩකුඹු කිරීම
- පළමුව කොඩිය මොහොතකට කොඩි ගසෙහි ඉහළටම ඔසවා යළි අඩකුඹු කරන ස්ථානය දක්වා පහත් කිරීම
- කොඩි ගසේ මුදුනේ සිට මුළු කොඩි ගසේ උසින් 1/3 ක ප්‍රමාණයක් පහත් කර ගැට ගැසීම
- දවස අවසානයේ පහත් කිරීමට පෙර එය නැවත මුදුනට ඔසවා ඉන් අනතුරුව පහත හෙළීම

## අධ්‍යාපන ආයතනවල ජාතික කොඩිය ඔසවා තැබීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු රීති

- සෑම පාසල් වාරයකම ආරම්භයේදී සහ වාරය තුළ සෑම මාසයකම ආරම්භයේ එසවීම
- රජය විසින් නියම කරනු ලබන විශේෂ දිනවල එසවීම
- ත්‍යාග ප්‍රදානෝත්සව, ක්‍රීඩා උත්සව ආදි විශේෂ අවස්ථාවල එසවීම

## ජාතික කොඩිය භාවිතයේ දී නොකළ යුතු දේවල්

- හානි වූ, අවලක්ෂණ වූ කොඩි ප්‍රදර්ශනය කිරීම
- සැරසිල්ලක් ලෙස භාවිත කිරීම
- සිංහයා උඩු යටිකුරු කර ප්‍රදර්ශනය කිරීම
- පොළොව ස්පර්ශවීමට සැලැස්වීම
- අඳින ඇඳුමක්, ඇතිරිල්ලක් ලෙස යොදා ගැනීම

- කිසියම් ලාංඡනයක්, පින්තූරයක්, වචනයක්, චිත්‍රයක් කොඩිය මත තැබීම
- ක්‍රීඩා ඇඳුමක් ලෙස යොදා ගැනීම (හමුදා, ගිනි නිවන හමුදා හා පොලිස් නිලධාරීන්ගේ ඇඳුමට කොඩියේ ලාංඡනයක් තබා මසා ගනු ලැබිය හැකිය.)

**ක්‍රියාකාරකම 3.6**

- ගුරුතුමා/ ගුරුතුමියගේ උපදෙස් අනුව නිවැරදි ඉරියව් භාවිත කරමින් ජාතික කොඩිය එසවීම සිදු කරන්න.
- ගුරුතුමා/ ගුරුතුමියගේ උපදෙස් පරිදි නිවැරදි ඉරියව් භාවිත කරමින් ජාතික කොඩිය අඩකුඹු කිරීමේ ක්‍රමවේදය අත්හදා බලන්න.

## ජාතික ගීය (National Anthem)

ජාතික කොඩිය මෙන්ම ජාතික ගීය ද රටක ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේතයකි. අප රටේ ජාතික ගීය "ශ්‍රී ලංකා මාතා" යන ගීතය වේ. ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ ආනන්ද සමරකෝන් සූරීන්ය.

රටක පුරවැසියන්හට තම මව්බිම පිළිබඳ අභිමානයක්, ආදරයක්, ගෞරවයක් මෙන්ම භක්තියක් ජනිත කිරීම උදෙසා ජාතික ගීය අතිශය වැදගත් වේ. එසේම ජාතික ගීය මගින් රටේ සියලුම වාර්ගික, ආගමික සහ භාෂා කතා කරන ජන කණ්ඩායම් නියෝජනය කරන අතර සියලු දෙනාම සමානය යන හැඟීමක් ඇති කරනු ලැබේ.

### ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා

- ජාතික උත්සව
- රාජ්‍ය උත්සව
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායක උත්සව
- පාසල් හා වෙනත් පොදු වැදගත්කමක් ඇති උත්සව
- ශ්‍රී ලංකාව නියෝජනය කරන ජාත්‍යන්තර තරග
- වෙනත් වැදගත් උත්සව

## අප රටෙහි ජාතික ගීය නිර්මාණය කිරීමේ පසුබිම

අප රට නිදහස ලබා ගැනීමට ආසන්නව පැවතිය ද ජාතික ගීයක් පැවතුණේ නැත. එම නිසා ජාතික ගී තරගයක් පවත්වා ජාතික ගීයක් තෝරා ගැනීමේ වගකීම ලංකා ගාන්ධර්ව සභාවට පැවරිණි. තරගය සඳහා ලැබෙන ගීතවල භාෂාව හා අදහස් පිළිබඳ සලකා බැලීමට සිංහල හා ද්‍රවිඩ විනිශ්චය මණ්ඩලයක් පත් කළ අතර සිංහල විනිශ්චය මණ්ඩලය ලෙස කටයුතු කරනු ලැබුවේ,

එස්.එල්.බී. කපුකොටුව මහතා

එල්.එල්.කේ. ගුණතුංග මහතා

ලයනල් එදිරිසිංහ මහතා

පී.බී. ඉලංගසිංහ මහතා

ආචාර්ය ඕ.එච්.ඩී.ඒ. විජයසේකර මහතා

මුදලිඳු ඊ.ඒ. අබේසේකර මහතා යන අයයි.

මෙම තරගය පැවැත්වූවේ 1948 ජනවාරි 31 වන දිනයි. ඒ සඳහා ආනන්ද සමරකෝන් සූරීන් රචනා කළ "නමෝ නමෝ මාතා" යන ගීය ද ඉදිරිපත් කර තිබුණි. මෙම තරගයෙන් ජයග්‍රහණය කළේ පී.බී. ඉලංගසිංහ මහතා රචනා කර ලයනල් එදිරිසිංහ මහතා සංගීතවත් කළ "ශ්‍රී ලංකා මාතා පාලා යස මහිමා ජය ජය" යන ගීතය වේ. ඒ අනුව 1948 පෙබරවාරි මස 04 වන දින පැවැත්වූ පළමු නිදහස් උත්සවයේදී ගායනා කළේ එම ගීතයයි. එහෙත් විනිශ්චය මණ්ඩලයේ දෙදෙනෙකු නිර්මාණය කළ එම ගීතය පිළිබඳ මහජන විරෝධයක් ඇති වුණ හෙයින් එය භාවිතයෙන් ඉවත් කෙරිණි. ඉන් අනතුරුව දෙවන නිදහස් දින උත්සවයේ දී, ආනන්ද සමරකෝන් සූරීන් රචනා කළ "නමෝ නමෝ මාතා" යන ගීතය ජාතික ගීය ලෙස ගායනා කළ අතර ඉන් අනතුරුව 1951 නොවැම්බර් 22 වනදා මෙම ගීතය අප රටේ ජාතික ගීය විය යුතු බවට කැබිනට් මණ්ඩලය තීරණය කළේය. පසුව 1961 පෙබරවාරි මස, "නමෝ නමෝ මාතා" යන මුල් පද පේළිය "ශ්‍රී ලංකා මාතා" ලෙස වෙනස් කර ගායනා කෙරිණි.

1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ අප රටේ ජාතික ගීය "ශ්‍රී ලංකා මාතා" ගීය වන බව දක්වා තිබේ. එහි පද මාලාව හා තනුව ව්‍යවස්ථාවට උපලේඛනයක් ලෙස ඇතුළත් කර තිබේ.

**ශ්‍රී ලංකා ජනරජයේ ජාතික ගීය "ශ්‍රී ලංකා මාතා" ගීය වන්නේය. ජාතික ගීයෙහි පද මාලාව සහ සංගීතය තුන්වන උපලේඛනයෙහි දැක්වෙන්නේය.**

ජාතික ගීයෙහි යම් සංශෝධනයක් සිදු කරනු ලබන්නේ නම් පාර්ලිමේන්තුව විසින් සහ ජනමත විචාරණයක් මගින් ජනතාව ද අනුමත කළ යුතුය.

අප රටේ ජාතික ගීයෙහි පද මාලාව ඔබට නොමිලේ ලැබෙන සෑම පෙළපොතකම ආරම්භයෙහි ඇතුළත් කර තිබේ. එය නිවැරදිව උච්චාරණය කර නියමිත තනුවට අනුව ශබ්ද නගා ගායනා කිරීම ඔබ සතු යුතුකමක් සහ වගකීමක් ද වේ. එසේම ජාතික ගීය ගායනා කරන විට සීරුවෙන් සිට එයට ගෞරව දැක්වීම ද කළ යුතුය.



3.27 රූපය - ජාතික ගීය ගායනා කරන විට සීරුවෙන් සිටීම

## රාජ්‍ය ලාංඡනය (State emblem)

රාජ්‍යයේ අයිතිය මෙන්ම අනන්‍යතාව තහවුරු කරනු ලබන සංකේතය රාජ්‍ය ලාංඡනයයි. වර්තමානයේ අප රටේ භාවිත වන රාජ්‍ය ලාංඡනය හඳුන්වා දී ඇත්තේ 1972 වර්ෂයේදී ය. 1972 මැයි 22 වන දින ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීම සමරනු අරභයා රාජ්‍ය ලාංඡනයක් නිර්මාණය කිරීම එවක සිදු විය. රාජ්‍යයට අයත් බව තහවුරු කිරීම සඳහා රාජ්‍ය ලාංඡනය සංකේතය වශයෙන් යොදා ඇති අයුරු ඔබ දැක ඇත. මුදල් නෝට්ටු, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලිපි ශීර්ෂ, විදේශ ගමන් බලපත්‍රය, ජාතික හැඳුනුම්පත ආදිය රාජ්‍ය ලාංඡනයේ මුද්‍රාව තබා ඇති දේ අතුරින් කිහිපයකි. රාජ්‍ය ලාංඡනයේ හිමිකාරිත්වය සහ භාවිත කිරීමේ අයිතිය හිමිවන්නේ ජනාධිපතිවරයාටයි. එයට ගරු කිරීම මෙන්ම ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකම වේ.

බ්‍රිතාන්‍ය යටත් විජිත සමයෙහි අප රටේ භාවිත කරන ලද්දේ සිංහයා සහ කඟවේනා සහිත බ්‍රිතාන්‍ය ලාංඡනයයි. නිදහස ලැබීමෙන් පසුව පළා පෙති සහිත වෘත්තයක් තුළ සිංහයා සහ ඊට ඉහළින් ඔටුන්නත්, පහතින් ලංකා යන්නත් යෙදූ ලාංඡනයක් භාවිත විය.

වර්තමානයේ අප භාවිත කරන රාජ්‍ය ලාංඡනය නිර්මාණය කරන ලද්දේ එස්.එම්. සෙනවිරත්න නැමති චිත්‍ර ශිල්පියා විසිනි. එම ලාංඡනය සඳහා යොදා ගත් සංකේතවලින් නිරූපණය වන දෑ පහත දැක්වේ.



3.28 රූපය
රාජ්‍ය ලාංඡනය

ධර්ම චක්‍රය - ධාර්මික බව

වී කරල් - සෞභාග්‍යය

දකුණතින් කඩුවක් ගත් සිංහයා - රට හා විනයගරුක ජාතිය

සිංහයා වටා ඇති පළා පෙති - පාරිශුද්ධ බව

පුන්කලස - පරිපූර්ණ බව

ඉර සහ සඳ - සදාකාලික පැවැත්ම




නොමිලේ බෙදාහැරීම සඳහා ය.

### ජාතික වෘක්ෂය (National Tree)

ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නා ගසයි. එහි උද්භිද විද්‍යාත්මක නාමය *Mesua ferrea* L.M. වේ. 1986 පෙබරවාරි 26 වන දින සිට ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය ලෙස නා ගස පිළිගෙන තිබේ. එසේ පිළිගැනීමට බලපෑ සාධක කිහිපයකි. ඒවා නම්,

- ශ්‍රී ලංකාවට උරුම ශාකයක් වීම (ඒක දේශීය)
- එහි ඇති ප්‍රයෝජනවත් බව
- ඓතිහාසික හා සංස්කෘතිකමය වැදගත්කම
- අලංකාරවත් හා පියකරු බව
- ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව පැවතීම
- වෙනත් රටක රාජ්‍ය ලාංඡනයක් ලෙස භාවිත නොකිරීම



3.29 රූපය - නා ගස



3.30 රූපය - නා මල

නා ගස ඈත අතීතයේ පටන් ම පූජනීයත්වයෙන් සලකා වැඳුම් පිදුම් කර ඇත. බෞද්ධ සාහිත්‍යයට අනුව මංගල, සුමන, රේවත හා සෝභිත යන බුදුවරුන් නා සෙවණෙහි බුද්ධත්වය ලබා ඇත. මතු බුදුවන මෛත්‍රීය බෝසතුන් නා ගසක් මුල බුද්ධත්වය ලබන බවට බෞද්ධ විශ්වාසයක් පවතී. ගෞතම බුදුන් වහන්සේගේ පළමු ලංකා ගමනෙහි මහියංගණයට වැඩි අවස්ථාවේ දී එහි නා පැළයක් රෝපණය කළ බවට විශ්වාසයක් පවතී.

**නා ගස හැඳින්වීමට විවිධ භාෂාවල යෙදෙන පද**

සිංහල - නා

දෙමළ - නාහ මරම් (நாக மரம்)

ඉංග්‍රීසි - අයන්වුඩ් (Ironwood)

හින්දි - නාග්කේශර්

පාලි හා සංස්කෘත - නාග

ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ මෙන් ම වියළි කලාපයෙහි ද බහුලව වැඩෙන නා ගස පන්සල් හා දේවාල ආශ්‍රිතව සුලභව දැකිය හැකි ය. එසේ ම මඟ දෙපස සෙවණ සඳහා ද නා ගස් රෝපණය කර ඇති අයුරු දැක ගත හැකි ය.

ඉතා අලංකාරවත් ශාකයක් වන නා ගසෙහි දලු තද රෝස පැහැයෙන් යුක්ත වේ. දලු මෝරායාමත් සමග කොළ වර්ණයට හැරෙයි. ඉතා තද ගතියෙන් යුත් නා ලීය දිගු කලක් පවතියි. පන්සල් හා දේවාල ඉදි කිරීම සඳහා පමණක් නා ලී භාවිතයට ගන්නා ආකාරය දැක ගත හැකි ය. අතීතයේ පාලම් හා ඒදඬු ඉදි කිරීම සඳහා නා ලී භාවිතයට ගෙන ඇත.

නා ගසෙහි ඖෂධීය ගුණය ඉතා ඉහළ ය. මුල්, පොතු, මල්, රේණු, ගෙඩි, දලු, කොළ ආදි සෑම කොටසක් ම ඖෂධ ලෙස භාවිතයට ගැනේ. නා මල්රේණු සුවඳ විලවුන් නිෂ්පාදනය සඳහා භාවිතයට ගැනේ.

**ජාතික පුෂ්පය** (National Flower)

ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය මානෙල් මලයි. එහි උද්භිද විද්‍යාත්මක නාමය *Nymphaea nouchali* Burm.f. වේ. වර්ෂය පුරා මල් පිපෙන ශාකයක් වන මානෙල් පහත රට සෑම ප්‍රදේශයක ම නොගැඹුරු ගංගා, ඇළදොළ, වැව් යනාදියේ හොඳින් වැඩේ. මෙම මල ඉතා සියුමැලි, ළා නිල් - දම් පැහැයෙන් යුක්ත වන අතර හිරු එළිය ලැබීමත් සමග විකසිත වෙයි. හිරු බැස යාමත් සමග පරව යාම සිදු වේ. නිම්ෆියා කුලයට අයත් ශාක දෙකක් හෝ කිහිපයක් හෝ එක ම ජලාශයක ඇති විට ස්වාභාවිකව දෙමුහුන් වීම


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙහි දක්නට ලැබෙන සුලබ ලක්ෂණයකි. එමගින් විවිධ නව ලක්ෂණ සහිත මල් හට ගැනීමට සුවිශේෂ හැකියාවක් මානෙල්වලට ඇති නිසා උද්‍යාන අලංකරණයේ දී ජනප්‍රිය ශාකයක් බවට පත්ව ඇත.



3.31 රූපය - මානෙල් මල

## ජාතික පුෂ්පය තෝරා ගැනීමේ පසුබිම හා එහි වැදගත්කම

ජාතික පුෂ්පය ලෙස මානෙල් මල තෝරා ගැනීමට පදනම් වූ සාධක කිහිපයකි. එහි ඇති ප්‍රයෝජනවත් බව, සංස්කෘතික, ඓතිහාසික, විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක වටිනාකම ඉන් ප්‍රධාන වේ. ඊට අමතරව ඒක දේශීය ශාකයක් වීම, වෙනත් රටක ජාතික පුෂ්පයක් ලෙස භාවිත නොකිරීම ආදි කරුණු ද සලකනු ලැබී ය.

ජාතික පුෂ්පය ලෙස නෙලුම් මල තෝරා ගත යුතු බව බොහෝ දෙනකුගේ අදහස විය. එහෙත් ඉන්දියාවේ ජාතික පුෂ්පය නෙලුම් මල වූ නිසා එය බැහැර කරනු ලැබී ය. ඒ අනුව 1986 පෙබරවාරි 26 වන දින ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ලෙස මානෙල් මල තෝරා ගනු ලැබිණි.

මානෙල් මල බෞද්ධ සාහිත්‍යය තුළ මෙන් ම චිත්‍ර කලාව, කාව්‍ය සම්ප්‍රදාය හා දේශීය වෛද්‍ය විද්‍යාව තුළ අතිශය වැදගත් තැනක් හිමි කරගෙන ඇත. ඉන්දීවර, නිලුපුල්, නීලුප්පල ආදි විවිධ නම්වලින් එය හඳුන්වා තිබේ. බුදුරදුන්ගේ ශ්‍රී පාද පත්ලෙහි පිහිටි මංගල ලක්ෂණ 108 අතර මානෙල් මල් දෙකක සලකුණු වූ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. එම නිසා මානෙල් මල සුබ ලකුණක් ලෙස සලකනු ලබයි. සීගිරි ලලනාවන් අත මානෙල් හා

නෙලුම් මල් වන බව සඳහන් කර පුරාතන කවියෝ කාව්‍ය සංකල්ප නිර්මාණය කර ඇත්තාහ. එසේ ම අතීත කාන්තාවන් කර්ණාභරණ ලෙස මානෙල් මල් පැලඳූ බව සන්දේශ කාව්‍යවල දක්වා තිබේ. පළමු වැනි කාශ්‍යප රජු විසින් තම දියණිය මානෙල් මලකට සමාන කර උප්පලවණ්ණා යනුවෙන් නම් තබා ඇත.

දේශීය වෛද්‍ය විද්‍යාව තුළ මානෙල් මලට අතිශය වැදගත් ස්ථානයක් හිමිව ඇත. ශාකයේ අල, දඬු, මල්රේණු, ඇට යනාදි සෑම කොටසක් ම ඖෂධීය කොටස් ලෙස භාවිතයට ගැනේ.

**මානෙල් මල හැඳින්වීමට විවිධ භාෂාවල යෙදෙන පද**

සිංහල - මානෙල්/නිලුපුල්

දෙමළ - නීලෝත්පලම් (நீலோற்பலம்)

ඉංග්‍රීසි - බ්ලූ වෝටර් ලිලී (Blue Water Lily)

හින්දි - නීලෝත්පල

පාලි - නීලුප්පල

සංස්කෘත - නීලෝත්පල

## ජාතික පක්ෂියා (National Bird)

අප රටේ ජාතික පක්ෂියා වලිකුකුළා (Jungle Fowl) වේ. වලිකුකුළා දිවයින පුරා වනාන්තර ආශ්‍රිතව දැක ගත හැකිය.

රංචු ලෙස ජීවත් වීම වලිකුකුළාට ආවේණික ලක්ෂණයකි. අනතුරක සේයාවක් දැනුණ විට ක්ෂණිකව කලබලයට පත් වීමත්, ආරක්ෂාව සඳහා උස් ස්ථානයක් කරා ඉගිලීමත් පුරුද්දකි. තම සාමාජිකයන්හට අනතුර පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශබ්ද නැගීම සිදු කරයි. ධාන්‍ය, ගෙඩි, පත්‍ර වර්ග, කුඩා කෘමි සතුන්, මල් පොහොට්ටු වැනි දෑ ආහාරයට ගනු ලබයි. හිරු පායා ඒමට ආසන්න අවස්ථාවේ දී හැඬලීම දෛනික කාර්යයකි. වලිකුකුළාගේ මිහිරි නාදය පිළිබඳ පැරණි ජන කවීන් විසින් වර්ණනා කර තිබේ. බාහිර

අනතුරුවලින් තොර වනාන්තර ආසන්නයේ පිහිටා ඇති නිවෙස් කරා කෑම සොයා පැමිණීමට වලිකුකුළන් පුරුදු වී ඇති අයුරු ඔබ දැක තිබෙන්නට පුළුවන. ඉතා අහිංසක මෙන්ම කඩිසර බවින් යුත් සත්වයෙකු වීම, අභියෝග හමුවේ පසු නොබසින ස්වභාවය, අන්‍යෝන්‍ය සහයෝගයෙන් ක්‍රියා කිරීම වලිකුකුළා සතු සුවිශේෂ චර්යා රටා වේ.



3.32 රූපය - වලිකුකුළා

ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා ලෙස වලිකුකුළා තෝරා ගැනීම කෙරෙහි බලපෑ එක් සාධකයක් වන්නේ එම සත්ත්වයා හා ලාංකික ගැමි ජීවිතය අතර බැඳුණු සමීප සම්බන්ධතාවයයි. වලිකුකුළාගේ කඩිසරබව හා බාහිර පෙනුමත්, ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂයක් වීමත් ඊට අදාළ අනෙක් කරුණු අතර වේ. වර්තමානයේ ශීඝ්‍රයෙන් වඳවෙමින් පවතින සත්ව විශේෂ අතරට වලිකුකුළා ද අයත් වේ. වලිකුකුළා ඇල්ලීම, රඳවා තබා ගැනීම, ඝාතනය කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි. එම නිසා ජාතික සම්පතක් ලෙස සලකමින් මෙම සතුන් ආරක්ෂා කිරීම පුරවැසියකු වශයෙන් අප සැමගේ යුතුකම වනු ඇත.

## ජාතික ක්‍රීඩාව (National Sport)

අප රටේ ජාතික ක්‍රීඩාව අත් පන්දු (Volleyball) වේ. එල්ලේ ක්‍රීඩාව අපගේ ජාතික ක්‍රීඩාව විය යුතු බවට අදහසක් පළමුව ඉදිරිපත් විය. එහෙත් ජාත්‍යන්තර ක්‍රීඩා තරග සඳහා යොදා ගැනීමේ පවතින දුෂ්කරතාව නිසා එම අදහස වෙනස් විය. සාමය, සමගිය, සහභාගිත්වය, ජය පරාජය සමසේ විඳ දරා ගැනීමේ ශක්තිය ඇති කිරීම වැනි උසස් ගුණාංග ඔප් නංවාලීම පිණිස මෙම ක්‍රීඩාව වැදගත් වේ. සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සව අවස්ථා, පාසල්, ක්‍රීඩා සමාජවල ක්‍රීඩා තරග ආදියෙහි බහුලව අත් පන්දු ක්‍රීඩාව යොදා ගනියි.

අත් පන්දු ක්‍රීඩාව ලොව ප්‍රථම වරට ආරම්භ වන්නේ ක්‍රි. ව. 1885 දී ඇමෙරිකා එක්සත් ජනපදයේ හෝලියොක් නගරයේ ය. අත් පන්දු ක්‍රීඩාව ලොවට හඳුන්වා දීමේ ගෞරවය විලියම් ජී. මෝගන් මහතාට හිමි වේ. අප රටට එය හඳුන්වා දෙන්නේ 1916 දී ඇමෙරිකානු ජාතික රොබට් වෝල්ටර් නම් ක්‍රීඩා අධ්‍යක්ෂවරයකු විසිනි.

කණ්ඩායම් ක්‍රීඩාවක් ලෙස අත් පන්දු ක්‍රීඩාවේ දී සාමූහිකව තරග කිරීමෙන් ජය ලබා ගැනීමට හැකියාව ලැබේ. කණ්ඩායමේ සෑම ක්‍රීඩකයකුම තම වගකීම නොපිරිහෙළා ඉටු කිරීම ජයග්‍රහණය සඳහා අතිශය වැදගත් වේ. එමෙන්ම වැඩි පිරිසකට අඩු පහසුකම් යටතේ එකවර ක්‍රීඩා කළ හැකිය. ලංකාව පුරා ව්‍යාප්ත ජනප්‍රිය ක්‍රීඩාවක් වීම වැනි ගුණාංග නිසා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව ලෙස අත්පන්දු ක්‍රීඩාව තෝරා ගෙන ඇත.



3.33 රූපය
අත්පන්දු ක්‍රීඩා කරන අවස්ථාවක්

## තම සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීම

කිසියම් ජනවර්ගයකට, ආගමික කණ්ඩායමකට, ජන සමූහයකට පාරම්පරිකව උරුම වී ඇති සංස්කෘතික අංග තම සංස්කෘතික අනන්‍යතාව ලෙස සරලව හැඳින්විය හැකි ය. නිදසුන් ලෙස සිංහල ජනවර්ගයට අයත් බෞද්ධයින් විසින් "වැඩිහිටියන් සමඟ සම අසුන්වල ඉඳ නොගැනීම, වැඩිහිටියන් සමඟ එකට එක නොකීම" ආදිය පෙන්වා දිය හැකි ය. තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගන්නා අතරම අනෙකුත් සංස්කෘතීන්වල අනන්‍යතාවට ගරු කිරීම ඉතා වැදගත් වේ. වෙනත් සංස්කෘතික අංග හෙළා නොදැකීම, ඒවා විවේචනය නොකිරීම, පරිභව නොකිරීම සහ අගෞරව වන පරිදි ක්‍රියා නොකිරීම ඉතා වැදගත් ය. තම සංස්කෘතික අංග ආරක්ෂා කරන ආකාරයෙන්ම හා ගෞරව කරන පරිදිම අනෙක් සංස්කෘතික අංග ද ආරක්ෂා කිරීමත්, ගෞරව කිරීමත් සිදු කළ යුතු ය. එය යහපත් පුරවැසියෙකු වශයෙන් අප සැමගේ යුතුකම හා වගකීම වේ. එවිට සෑම සංස්කෘතික කණ්ඩායමක් අතරම අන්‍යෝන්‍ය විශ්වාසය, ගරුත්වය සහ සහජීවනය ඇති වේ. ගැටුම්වලින් තොර සාමකාමී සමාජ පරිසරයක් නිර්මාණය වේ.

## සාරධර්ම යනු කුමක්ද?

පුද්ගලයා, සමාජය හා ජීවිතය සාරවත් කරන, පොහොසත් කරන මානුෂික ගුණාංග සාරධර්ම (Morals) වේ. ජීවිතය සාරවත් කිරීම සඳහා සාරධර්ම වැදගත් වේ. එම සාරධර්ම සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට මෙන් ම යහපත් සමාජයක් බිහිවීමට ද හේතු වේ. ඒ අනුව පුද්ගල ජීවිතය හා සමාජ ජීවිතය අර්ථවත් කරන, සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් ඇති යහපත් සමාජයක පැවැත්මට අදාළ මානව ගුණධර්ම, සාරධර්ම ලෙස හැඳින්විය හැකි ය.

සමාජය නිර්මාණය වී පවතින්නේ පුද්ගලයන් සමූහයක එකතුවකිනි. එම පුද්ගලයන්ගේ ගුණගරුක බව තුළින් සමස්ත සමාජය ගුණගරුක සමාජයක් බවට පත් වේ. දිගු කාලයක් සමාජය තුළ පොදුවේ පිළිගැනීමට ලක්ව පවතින්නා වූ ගුණාංග පද්ධතියක් සාරධර්ම ලෙස හැඳින්විය හැකි ය. ඒවා නීතිමය වශයෙන් බලවත් නොවන නමුත් සමස්ත සමාජය පාලනය කරනු ලබන, හසුරුවනු ලබන සහ මඟ පෙන්වනු ලබන ප්‍රධාන මෙවලමක් බවට පත් වේ.

## පුද්ගලයෙකු තුළ වර්ධනය කළ යුතු සාරධර්ම

- විනයගරුක බව
- අවංක බව
- ඉවසීම
- නිහතමානී බව
- ත්‍යාගශීලී බව
- මිත්‍රශීලී බව
- කාරුණික බව
- ක්‍රෝධ නොකිරීම
- දයාව

## සමාජ යහපැවැත්ම සඳහා සාරධර්මවල අවශ්‍යතාව

සමාජ යහපැවැත්ම උදෙසා සෑම පුද්ගලයකු විසින්ම සාරධර්ම පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. සමාජයක යහපැවැත්ම තීරණය වන්නේ එම සමාජ ක්‍රමය තුළ ජීවත්වන පුද්ගලයන් විසින් ආරක්ෂා කරනු ලබන සාරධර්ම මතයි. එදිනෙදා ජීවිතයේ දී අප විසින් සාරධර්ම ආරක්ෂා කිරීම මෙන්ම ඒවා අනුගමනය කිරීම සඳහා යොමු වීම වැදගත් වේ. තම නිවස, ආගමික ස්ථාන, සේවා ස්ථාන ආදි සෑම තැනකදීම ඊට අදාළ සහ උචිත සාරධර්ම ආරක්ෂා කිරීමටත්, ඒවාට ගරු කිරීමටත් ක්‍රියා කළ යුතු ය.

පුද්ගලයකු සාර්ථකත්වයට පත් වන්නේ එම පුද්ගලයා සතු ගුණාංග අනුව වේ. පුද්ගලයකුගේ සංවර්ධනය සඳහා සාරධර්ම අත්‍යවශ්‍ය වන අතර ඒවා තම ජීවිතයට බද්ධ කර ගත යුතු ය. පුද්ගලයකුගේ සංවර්ධනය උදෙසා සාරධර්ම අත්‍යවශ්‍ය වන්නාසේම, එදිනෙදා කටයුතු කිරීමේ දී සාරධර්ම තම ජීවිතයට බද්ධ කර ගැනීම සඳහා යොමු වීමත් ඉතා වැදගත් ය. එවිට යහපත් සමාජයක් ගොඩනැගීමට හැකිවනු ඇත.

ඈත අතීතයේ සිට සාරධර්ම පිළිපැදීමේ වැදගත්කම අවධාරණය කර ඇත. සිරිත් මල්දම, සුභාෂිතය, ලෝකෝපකාරය වැනි පද්‍ය කෘතිවලින් ඒ බව

මනාව තහවුරු වේ. පහත දැක්වෙන්නේ සාරධර්ම ඉස්මතු කරන එවැනි කවි කිහිපයකට නිදසුන් ය.

**ඇනුම් පද නො කියමි**
**බැනුම් කැත බස් නො කියමි**
**නිකම් බස් නො කියමි**
**තරම් පමණට වදන් තෙපලමි**

(මම ඇනුම් පද නො කියමි. නො බනිමි. නරක වචන නො කියමි. හිස් වචන නො කියමි. මම මගේ තරම දැන කථා කරමි )

සිරිත් මල්දම

**ඉසුරෙන් පිරිහුණත්**
**සුදන තම ගුණය අඩු නො කරත්**
**බිඳුණත් රන් බඳුන**
**ඇති බර අගය අඩු නොවන මෙනි**

(යහපත් අය සැප සම්පත්තියෙන් පිරිහී ගියත් ඔවුන් ගේ ගුණ යහපත්කම් නම් පිරිහෙන්නේ නැත. රත්රන් භාජනය බිඳුණත්, ඒ භාජනයේ ඇති බරත් අගයත් අඩු නොවන්නා මෙනි.)

ලෝකෝපකාරය

**තිරසර ගුණෙන් යුතු මහතෙකු හට පවර**
**සමුදුරු සියල් කිඳලෙක තුඹසෙක සුනෙර**
**පුවතර මෙ දඹදිව මළුවෙක සිය ගෙදොර**
**ඔහු කර නොවන සැපතක් එ බැවින් කවර**

(ස්ථිර සාර ගුණයෙන් යුත් උතුම් මහත්මයෙකු හට මහා සාගරය දිය කඩිත්තෙකි. මහමෙර තුඹසෙකි. සුප්‍රකට මේ ජම්බුද්වීපය තමාගේ ගේ දොරකඩ මිදුලය. ඒ නිසා ඔහුගේ අතට පත් නොවන සැපතක් කවරේ ද? )

සුභාෂිතය

**ක්‍රියාකාරකම 3.7**

- සිරිත් මල්දම, ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය, සුභාෂිතය, ප්‍රත්‍යශතකය, හිතෝපදේශය, ව්‍යාසකාරය වැනි පද්‍ය කෘති ඇසුරින් සාරධර්ම ඉස්මතු කෙරෙන කවි කිහිපයක් කට පාඩමින් පන්තිය ඉදිරියේ ගායනා කරන්න.
- ඒවා අනුගමනය කිරීමෙන් තමාටත්, සමාජයටත් ඉටුවන මෙහෙය පිළිබඳ කෙටි අදහසක් පන්තියට ඉදිරිපත් කරන්න.